# ඖෂධ වවමු ඉසුරු ලබමු



## 10. වදකහ

**උද්භිද නාමය** - Acorus calamus Linn

**ශාක කුලය** - ARACEAE

**පොදු සිංහල නම** - වදකහ

**සංස්කෘත නාමය** - වචා

**ද්‍රවිඩ නාමය** - වසම්බු

**ඉංග්‍රීසි නාමය**- Calamus root/ Sweet Flag

**රෝපණ ද්‍රව්‍ය - අග්‍රස්ථ අංකුර සහිත** අල කැබලි

**ඖෂධ සදහා ගැනෙන ව්‍යවහාර අංග-**

සම්පූර්ණ ක්ෂුපයම
වියලා ගන්නා ලද අල විශේෂයි

**හැඳින්වීම**
හිත සන්සුන් කරන මනස පැහැදිලි කරන මුත්‍ර පිරිසිදු කරන ධාරණ ශක්තිය වඩන ඔසුවක් ලෙස ප්‍රකට වද කහ දරුවන් සහ ළමයින්ගේඅජීරණ පණුවමන අවස්ථා වලදී අත් බෙහෙතක් වශයෙන් බොහෝ ප්‍රයෝජනවත් වන පැළෑටියකි. වෙනත් බෝග වගා කළ නොහැකි මඩ වගුරු ආශ්‍රිත බිම් වද ගහ වගාවට යෝග්‍ය වන බැවින් ආර්ථික වගාවක් ලෙස වදකහ වගා කිරීමෙන් විදේශයන්ට ඇදී යන විශාල ධනස්කන්ධයක් ඉතිරි කර ගැනීමට හැකිවනු ඇත.

**උද්භිද විද්‍යාත්මක විස්තරය -**
වගුරු බිම් පස යට වැඩෙන කඳකින් යුත් අවුරුදු ගනනක් පවතින සුවඳවත් කඳක් සහිත පැළෑටියකි . කෙටි හා බිම දුවන අතු බෙදුණු ආකන්ධයකින් යුක්තය. පත්‍ර සරලය. ද්වීපන්තිකය. සෙන්ටිමීටර් 90- 180 පමණ දිගය. පළල සෙන්ටිමීටර් 1.5-4 පමණ වේ.දීප්තිමත් කොළ පාටය. තීව්‍රය. මධ්‍යයේ ඝනවී ඇත. දාර තරංගීය. නාරටි සමාන්තරය.

**කෘෂි විද්‍යාත්මක විස්තරය**
වගාව සඳහා අග්‍රස්ථ අංකුර ආශ්‍රිත පුරුක් භාවිතා කරන අතර වදල හා ජලයට ලැදි ඖෂධ පැළෑටියක් බැවින් සෙවන හේතුවෙන් වී වගාවට අයෝග්‍ය ලියදිවල පහසුවෙන් වගා කළ හැක. ලියද්දේ සෙන්ටිමීටර් පහක් පමණ ජල මට්ටමක් පවත්වා ගැනීමෙන් පාර්ශ්වික අංකුරු වල අනවශ්‍ය වර්ධනය පාලනය කළ හැකිය.

පිම් සැකසීමෙන් පසු පැළ සිටුවීමට සුමාන 02 පෙර හොඳින් දිරාපත් වූ කාබනික පොහොර ගෝනි එකක් මීටර් 3*3 ලියද්දකට එක්කොට පස හා හොඳින් මිශ්‍ර කරන්න. පැළ සිටුවීමේ පරතරය සෙන්ටිමීටර් 45* 45කි.

**අස්වනු නෙළීම හා ගබඩා කිරීම**

පැළ සිටුවා මාස 9-18 අතර කාලයක් තුළ අස්වනු නෙලා ගත හැකිය. ලියද්දේ අතරින් පතර කොළ පැහැති කරලක් මෙන් පෙනෙන පුෂ්ප හට ගැනීම ආරම්භ වන විට අස්වනු නෙළීම ආරම්භ කිරීම වඩාත් යෝගය. කඳ නොකැඩෙන ලෙස ගලවා ගත් වදකහ පැළෑටිවල අග්‍රස්ථ අංකුරු සහිත පුරුක් නැවත රෝපණය සඳහා ඉතිරි කරගෙන භූගත කඳෙහි පත්‍ර හා මුල් ඉවත්කොට සෙන්ටිමීටර් 20ක පමණ කැබලි වලට කපා මද පවනේ වියළා ගන්න.වදකහ භූගත කදෙහි වාෂ්පශීලී තෛලමය සංයෝග අඩංගු බැවින් තද හිරු එළියෙහි වියලීම නොකළ යුතුය. ජලය ඉවත්වී හොඳින් වේලෙනු පසු කැබලි කපු රෙදි මලුවල හෝ ගෝනි වල අසුරා වියලි සිසිල් ස්ථානයක තැන්පත් කරන්න.

**වර්තමාන භාවිතය හා වෙළඳපළ තත්ත්වය**

ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සදහා අති බහුල භාවිතයකින් යුතු ඖෂධීය අමුද්‍රව්‍යයක් වන වදකහ ආයුර්වේද ඖෂධ ආනයන වාර්තා සැලකීමේදී මෑතකදී සීඝ්‍රයෙන් ආනයනය වැඩි වූ ඖෂධයකි. වාර්ෂිකව කිලෝග්‍රෑම් 40000ක් පමණ මෙරට තුළ භාවිතාවේ.

කිලෝ ගෑම් එකක මිළ

සැකසුම
වෛද්‍ය ලක්ශාන්ත ගුණසිංහ
ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී-
ගගවට කෝරළය